**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2024**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ (“මණ්ඩලය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, ඊට සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණ සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### \2.1 මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, මණ්ඩලයේ ප්‍රධාන ආදායම් මාර්ගය රජයේ ප්‍රදාන වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය තුළ රු. 33,123,482 කින් හෙවත් සියයට 46 කින් වැඩි වී තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු වියදම ද රු.33,123,482 කින් හෙවත් සියයට 46 කින් වැඩි වී තිබුණි. එකතුව රු. 70,277,322 ක් වූ කාර්ය මණ්ඩල පිරිවැය සහ ගොඩනැගිලි කුලිය සමාලෝචිත වර්ෂය සඳහා වූ මුළු වියදමෙන් සියයට 67 ක් නියෝජනය කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ මුළු වියදමෙන් සියයට 68.5 ට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වී තිබුණි. විස්තර පහත සඳහන් පරිදි වේ.

| අයිතමය | වර්ෂය සඳහා | | වැඩිවීම / (අඩුවීම) | |
|---|---|---|---|---|
| | 2024 | 2023 | | |
| | රු. | රු. | රු. | % |
| මුළු වියදම | 104,668,457 | 71,544,975 | 33,123,482 | 46.29 |
| කාර්ය මණ්ඩල පිරිවැය සහ ගොඩනැගිලි කුලිය | 70,277,322 | 49,014,373 | | |
| මුළු වියදමෙන් ප්‍රතිශතය (%) | 67.14 | 68.50 | | |

වැටුප් පිරිවැය 2023 වර්ෂයේ රු.35,050,482 සිට 2024 වර්ෂයේ රු.53,418,460 දක්වා රු.18,367,978 කින් හෝ සියයට 52 කින් වැඩි වීමට ප්‍රධාන හේතුව වශයෙන් සමාලෝචිත වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද වැටුප් සංශෝධනය බලපාන ලදී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්වල මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ 23 වැනි වගන්තියට අනුව, මණ්ඩලයේ කාර්යය වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ විගණන ප්‍රමිතීන්ට නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් (SBEs) විසින් අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමයි. ඒ අනුව, පනත යටතේ නියම කර ඇති නිර්ණායක සපුරාලන බවට මණ්ඩලය විසින් මුළු SBEs 1,708 ක් හඳුනාගෙන තිබුණි. මෙයින්, ඉහත කාර්යය සඳහා සමාලෝචිත වර්ෂය තුළ SBEs හි මූල්‍ය ප්‍රකාශන කට්ටල 500ක් සමාලෝචනය කිරීමට මණ්ඩලය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන කට්ටල 112 ක් හෝ සැලසුම් කළ මූල්‍ය ප්‍රකාශන කට්ටලවලින් සියයට 22 ක් මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි. | පවතින කාර්ය මණ්ඩලය සමඟ ප්‍රශස්ත මට්ටමක් මත පදනම්ව මෙම ඉලක්ක සකසා ඇත.<br>2024 මාර්තු සිට අප්‍රේල් දක්වා කාලය තුළ අධ්‍යක්ෂ අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ යන තනතුරු සඳහා පිළිවෙලින් 1ක් සහ 3ක් බැගින් පමණක් බඳවා ගැනීමට මණ්ඩලයට හැකි විය. තවද, මෙම කාලය තුළ එක් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ අධීක්ෂණ නිලධාරියකු ඉල්ලා අස්විය. නව කාර්ය මණ්ඩලය ප්‍රමිති සහ සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳව පුහුණු කළ යුතු වේ. තවද, ඔවුන්ගේ ඉගෙනුම් කාලය තුළ, ඔවුන්ට සම්පූර්ණ කළ හැකි සමාලෝචන ගණන ඉතා අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුලින් සැලසුම් කළ සමාලෝචන සංඛ්‍යාව සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. තවද, පරිපාලන කාර්ය මණ්ඩලය නොමැති බැවින් බාහිර සමාලෝචකයින් 2024 දෙසැම්බර් මාසයේදී පමණක් සම්බන්ධ කර ගැනීමට හැකි විය. | සැලසුම් කර ඇති පරිදි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්වල මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව වැඩි කළ යුතු වේ. |

### 3.2 ව්‍යාපෘතිය නිම කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මගේ පෙර විගණන වාර්තාවල සඳහන් කර ඇති පරිදි, මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු නිර්මාණ සැලසුම් කිරීම සහ අධීක්ෂණය සම්බන්ධ උපදේශන සේවා සඳහා 2019 ජනවාරි 30 වැනි දින මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) සමඟ ගිවිසුමකට එළැඹ තිබුණි. උපදේශන ගාස්තුව සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7ක් ලෙස එකඟ වී තිබුණි. 2021 ඔක්තොම්බර් 27 වන විට SEC වෙත | පසුගිය කාලය තුළ ප්‍රාග්ධන වියදම් සඳහා රජය විසින් අනුගමනය කළ දැඩි අරමුදල් වෙන් කිරීමේ ප්‍රතිපත්ති හේතුවෙන් අභ්‍යන්තර කටයුතු නිර්මාණ සැලසුම් කිරීම සහ අධීක්ෂණය අවසන් කිරීමට නොහැකි විය.<br>2025 මාර්තු මාසයේ අයවැයට අනුමැතිය ලැබීමත් සමඟ SEC සමඟ සාකච්ඡා නැවත ආරම්භ කරන ලදී. | නියමිත කාලසීමාව තුළ කාර්යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| ලබා දී ඇති මුළු මුදල රු. 1,197,814 ක් සමඟින් උපදේශන සේවා සංවර්ධන අදියර දක්වා පමණක් ප්‍රගතියක් ලබා ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉතිරි වැඩ විෂය පථය 2025 මැයි 31 දක්වා ද අවසන් කර නොතිබුණි. | මේ වන විට, SEC විසින් ප්‍රමාණ පත්‍ර ඇතුළුව අවශ්‍ය ලියකියවිලි සකස් කරමින් සිටී. අප විසින් ළඟදීම ලංසු කැඳවීමේ කටයුතු කරගෙන යාමට අදහස් කර ඇත. | |

### 3.3 මණ්ඩලයේ පාරිතෝෂිත අරමුදල කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇති පාරිතෝෂිත සඳහා වෙන් කිරීම රු. 9,761,906 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රජයේ ප්‍රදාන උපයෝගී කර ගනිමින් රු. 5,100,000 ක මුදලක් පාරිතෝෂිත අරමුදලට මාරු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂිත අරමුදල් ශේෂය රු. 18,920,955ක් වූ අතර, එය රු. 9,159,048ක වැඩි වීමක් හෝ 2024 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂිත ප්‍රතිපාදනවලට සාපේක්ෂව අරමුදල දෙගුණයකින් වැඩි වීමක් විය. තවද, පාරිතෝෂික අරමුදලට මාරු කර ඇති එම මුදල තීරණය කිරීම සඳහා ලේඛනගත පදනමක් හෝ ස්ථාපිත ක්‍රමවේදයක් නොමැති බව ද නිරීක්ෂණය විය. ඒ අනුව, මාරු කර ඇති මුදල තීරණය කිරීම කිසිදු තාර්කික පදනමකින් හෝ ආධාරක නිර්ණායකයකින් තොරව කළමනාකරණයේ අභිමතය පරිදි පමණක් සිදු කරන බව නිරීක්ෂණය විය. | පාරිතෝෂික වගකීම් කාලීනව සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පවතින බව සහතික කිරීමේ අරමුණින් සත්‍ය වගකීම ඉක්මවා ඇති මෙම අතිරේක මාරු කිරීම් සිදු කරන ලද බව අපි පිළිගනිමු. කෙසේ වෙතත්, ඉදිරියට, එවැනි මාරු කිරීම් කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු සත්‍ය වගකීම්වලට දැඩි ලෙස සීමා වන බවට සහතික වේ. | පාරිතෝෂික අරමුදලට කෙරෙන මාරු කිරීම් සත්‍ය වගකීමට පමණක් දැඩි ලෙස සීමා වන බවට සහතික විය යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 33ක් වූ අතර සත්‍ය සේවක සංඛ්‍යාව 15ක් වූ බැවින් පුරප්පාඩු 18ක් විය. එයින්, මණ්ඩලය ආරම්භයේ සිටම නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරක් පුරප්පාඩු වී තිබුණි. මීට අමතරව, 2024 දෙසැම්බර් 31 වන විට අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 4ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 6ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 4ක් සහ එක් විධායක නිලධාරියෙකු පුරප්පාඩු වී තිබුණි. ඒ අනුව, විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු වී තිබීම මණ්ඩලයේ ඵලදායි ක්‍රියාකාරිත්වයට බලපෑ හැකි බව නිරීක්ෂණය වේ. | මෙම පුරප්පාඩු පිරවීම සඳහා, නිතිපතා පුවත්පත්වල සහ විවිධ මාධ්‍ය වේදිකා හරහා දැන්වීම් පළ කර ඇත. තවද අධීක්ෂණ තනතුරු වඩාත් ආකර්ශනීය කිරීමට පියවර ගන්නා ලදී. | අනුමත කිරීම් ලැබීමෙන් පසුව, යෝග්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු විම. |